**කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කිරින්ද- පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව තිබූ රු.2,371,214 ක වටිනාකම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ මුරකුටිය ඉදිකිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.314,168 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ අක්කර බදු ආදායම රු.121,236 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය ලේඛනයේ එකතුවේ වූ රු.99,910 ක අඩුවීම සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

(ඉ) කුලී පදනම මත ලබාදී තිබූ වාහන වෙනුවෙන් ඉකුත් වර්ෂයට අදාලව ලැබී තිබූ රු.261,975 ක ආදායම වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ නිමකර තිබූ එකතුව රු.537,711 ක් වූ කර්මාන්තවල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂවලට අදාළව කර්මාන්ත වෙනුවෙන් ගෙවියයුතු රු.49,410 ක ප්‍රාග්ධන වියදම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඖ) සභාවේ වාහන යොදාගෙන සිදු කර තිබූ මාර්ග අලුත්වැඩියා කිරීම් වෙනුවෙන් වැයවූ රු.112,293 ක මුදල කර්මාන්ත ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 02 ක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල් රු.91,342 ක් වැඩියෙන් හා කර්මාන්ත 04 ට අදාළව ගෙවිය යුතු මුදල් රු.121,636 ක් අඩුවෙන් ද දැක්වුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාළ කඩකුලී ආදායම් රු.85,648 ක් වැඩියෙන් බිල්කර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුල ගිණුම් අතර මුදල් මාරු කිරිම නිසා ජනිත වූ රු.513,447 ක හර ශේෂයක් ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ රු,3,109,331 ක් අඩුවෙන් දක්වා තිබුණි.

## 1.3.2 නොසැසඳුණු ගිණුම්

------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 22,462,909 ක් වූ ගිණුම් විෂයයන් 15 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර අසමානතාවල එකතුව රු.5,742,496 ක් විය.

## 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබියයුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.3,517,545 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ ශේෂ 02 ක එකතු වටිනාකම රු.389,051 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු. 3,166,381 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ වටිනාකම රු.751,876ක් වූ ශේෂ 07 ක් විය.

(ii) ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙනෙමින් පවතින එකතුකළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ශේෂවල රු.791,917 ක් වූ එකතු වටිනාකම නිරවුල්කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.41,760,363 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.2.5 අනුකූල නොවීම්

--------------------

### 1.3.5.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 164 | සභාවේ ගිණුම් ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරික්ෂා කර ඒ බවට කෙටි අත්සන් තබා තහවුරු කළයුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද 1992 පෙබරවාරි මස 26 දිනැති අංක 05/01/119/විix දරන උපදෙස් ලිපිය | සැලසුම් කමිටු දීමනාව ගෙවීම සඳහා පැය 02 කට වැඩි කාලයක් රාජකාරි වේලාවෙන් බැහැරව කටයුතු කළ යුතු වුවද, ඊට අදාළ නොවන අයුරින් රු.24,000 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. |
| (ඇ) 2014 දෙසැ. 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2014 හා 2015 ඔක්තෝබර් 25 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03(i) /2014 | චක්‍රලේඛ උපදෙස්වලට අදාළ නොවන අයුරින් ප්‍රජා සංවර්ධන නිලධාරිනියට රු.21,242 ක දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,270,046 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,729,662 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,036,500 | 1,364,486 | 1,228,367 | 702,361 | 906,500 | 999,626 | 1,067,916 | 566,242 |
| කුලී | 2,841,900 | 4,834,421 | 3,689,625 | 1,267,937 | 1,158,000 | 1,418,509 | 2,361,513 | 123,141 |
| බලපත්‍ර ගාස්තු | 135,250 | 145,412 | 145,412 | 124,900 | 98,000 | 137,512 | 1,070,969 | 124,900 |
| වෙනත් ආදායම් | 4,758,500 | 6,788,274 | 8,608,683 | 5,053,713 | 3,597,500 | 8,402,134 | 3,319,268 | 6,874,122 |
| -එකතුව- | 8,772,150 | 13,132,593 | 13,672,087 | 7,148,911 | 5,760,000 | 10,957,781 | 7,819,666 | 7,688,405 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

---

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත මුළු ආදායම රු.8,772,150 ක් වූ අතර බිල්කළ ආදායම රු.13,132,593 ක් විය. රු.7,688,405 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.20,820,998 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.13,672,087 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු. 7,148,911 ක් වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

---

(අ) වරිපනම්

---

ආරම්භක හිඟය රු.602,119 ක් වූ අතර, රු.425,990 ක් වූ බිල්කිරීම් සමඟ රු.1,028,109 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.419,899 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.608,210 ක් දක්වා හිඟ ශේෂය වර්ධනයවී තිබුණි.

(ආ) අක්කර බදු

---

ආරම්භක හිඟය රු.130,726 ක් වූ අතර, බිල් කිරීම් රු.12,482 ක් විය. වර්ෂය තුළ මුළු අයවීම් රු.10,599 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.132,609 ක් හිඟව පැවතුණි.

### 2.2.4 බදු කුලී

---

ආරම්භක හිඟය රු.164,783 ක් වූ අතර, රු.1,336,663 ක් වූ බිල්කිරීම් සමඟ රු.1,501,446ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,306,013 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.195,433 ක් හිඟව පැවතුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.207,450 ක් හා මුද්දර ගාස්තු රු.7,955,594 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කාර්යසාධනය

---

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිලිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම (output) ලබා නොගැනීම**

---

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ ව්‍යාපෘති 21 ක් නිම කිරීම වෙනුවෙන් රු.3,453,535 ක මුදලක් අනුමත කර තිබුණි. මෙම ව්‍යාපෘතිවලට අදාළ

කාර්යයන් 2017 නොවැම්බර් 30 දිනට පෙර නිම කළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 2,341,753 ක් වූ ව්‍යාපෘති 15 ක් නිම කර නොතිබුණි.

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

රාජ්‍ය ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් දන්වා තිබූ පරිදි සභාවට පිටුපස පිහිටා ඇති පස් කන්ද අස්ථාවර බැවින් නායයාමේ අවදානම් සහිත කලාපයට අයත් බවට නිර්දේශ කර තිබුණි. ඒ අනුව නිරාවරණය වූ කැපූ කණ්ඩි සකස් කර ස්ථාවර කිරිමට නිර්දේශ ඉදිරිපත් කර තිබුණද 2018 ජනවාරි 15 දින වන විටත් අදාළ කාර්යය ඉටුකර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 02 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාවේ 15 ක අතිරික්තයක් පැවතුණි.

(ii) අනුමත නොවූ කාර්යමණ්ඩලයට අයත් පෙර පාසල් පාලිකාවන් 03 දෙනෙකු සම්බන්ධව රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2014 දෙසැම්බර් 12 දිනැති 25/2014 චක්‍රලේඛය පරිදි කටයුතු කර නොතිබුණි.

(iii) භාණ්ඩාගාර ලේකම්ගේ 3/2014 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි සේවකයන් 09 දෙනෙකු බඳවාගෙන 2014 වර්ෂයේ සිට සභා අරමුදලින් වැටුප් වශයෙන් රු.4,304,241 ක් ගෙවා තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

------------------------------------------

සභාව සතු අක්කර 03 රූඩ් 01 පර්චස් 1.1 කින් යුත් ඉඩම් කැබලි 17 ක ආරක්ෂාව සඳහා පියවර ගෙන නොතිබුණි.

**3.4.2 නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්**

------------------------------------------

(අ) සභාව සතු අක්කර 02 රූඩ් 01 පර්චස් 15.37 ක් වූ ඉඩම් කැබලි 08 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) පිරිවැය රු.1,399,400 ක් වූ වාහන 03 ක් නිශ්ක්‍රීයව පැවති නමුත්, ඒවා අළුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5 ආර්ථික නොවූ ගනුදෙනු**

2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ යන්ත්‍රෝපකරණවල මූලික නඩත්තුව සඳහා වැය කිරීමට අනුමත කර තිබුණු මුදලින්, රු.893,400 ක් වටිනා ටයර් 32 ක් මිලදී ගෙන තිබුණි. අවශ්‍යතාවය හඳුනා නොගෙන මිලදී ගැනීම නිසා රු819,400 ක් වටිනා ටයර් 26 ක් ම ගබඩාවේ රඳවා තිබුණි. තවද 2013 වර්ෂයට පෙර මිලදී ගෙන තිබූ රු.68,400 ක් වටිනා ටයර් 06 ක් ද ගබඩාවේ තිබුණි. රු.364,200 ක් වටිනා ටයර් 10 ක් තොග ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 06 ක එකතුව රු.7,512,566 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම අගයන් සියයට 17 සිට සියයට 44 දක්වා පරාසයක පැවතුණි.

(ආ) වියදම් විෂයයන් 01 ක අහිතකර විචලනය රු.56,881 ක් වූ අතර, එම අගය සියයට 43 ක් විය.

(ඇ) ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.3,213,400 ක් වූ අතර, එම අගයන් සියයට 13 ක් හා සියයට 66 ක් විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගෙන් විමසීම් කර නොතිබුණි. එමෙන්ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් රැස්කිරීම

(ඇ) අයවැය පාලනය

(ඇ) ගිණුම්කරණය